ඕනෑම දෙවිකෙනෙක් වඩින

ගෙදරදීම සාදාගත හැකි අතිප්‍රබල ඖෂධ අඳුනක්

බොහෝ දෙනෙක් දුරකතනය ඔස්සේ මා අමතමින් කළ කතා බහක් ඇසුරින් ගුප්ත විද්‍යාව සම්බන්ධයෙන් ඔවුන්ට තිබෙන්නාවූ අනේකවිධ ගැටලු සමහරක් හඳුනාගන්නා ලදී. ඒ අතර ගුප්ත විද්‍යාවේ සත්‍ය ගවේෂණය කරන බොහෝ දෙනෙක් මා අමතමින් නියමානුකූල අංජනමක් සාදා ගන්නා ක්‍රම ශිල්පය පුවත්පතේ පළ කරන ලෙස ඉල්ලා සිටියහ. මේ සියලු ගුප්ත විද්‍යාංගයන් ගවේෂණය කරමින් ඒවායේ ගැබ් වූ සත්‍යය නූතන විද්‍යාත්මකව පහදා දීම මගේ අරමුණයි. ඒ තුළින් මේ විෂය ක්ෂේත්‍රයේ නිරත වන කිසිදු ගුප්ත විද්‍යාඥයකු හෙළා දැකීමට හෝ විවේචනය කිරීමට අදහස් නොකරමි. මේ මට්ටමින් හෝ එම ගුප්ත විද්‍යාත්මක කාර්යයන් අනාගතය උදෙසා පවත්වාගෙන යෑම පැසසිය යුත්තකි. එසේ නමුත් යමෙකු විසින් මේ මහා විද්‍යාත්මක සත්‍ය ලාභ පරමාර්ථ උදෙසා, අනුන් මුළා කරන අටියෙන් අයහපත පිණිස යොදා ගන්නේ නම් එය දෙලොවම විපාක ලැබෙන බලවත් අකුසල කර්මයක් බැව් සිහි තබා ගැනීම මැනවි.

බොහෝ දෙනාගේ ඉල්ලීම මත නිවැරැදි අංජනම් එළියක් පිළිබඳ විස්තර ලබා දෙන්න අදහස් කෙරුවෙමි. මෙය විද්‍යාත්මකව අත්හදා බලා එහි ප්‍රතිඵල පිළිබඳ මා දැනුම්වත් කරන්නේ නම් අගය කොට සලකමි. පහත දැක්වෙන්නේ සිංහලයන්ටම උරුම වූ පැරැණි පුස්කොළ පොතකින් ලබාගත් අතිප්‍රබල අංජනමකි.

බෙහෙත් වට්ටෝරුව

සෞවිරාංජන, රසාංජන, ශ්වේතාංජන පුෂ්පාංජන, නීලංජන, රක්ත මාණික්‍යය, වජ්‍ර මාණික්‍යය, ප්‍රවාල මාණික්‍යය, ගෝමේද මාණික්‍යය, නීල මාණික්‍යය, වෛඩූර්‍ය්‍ය මාණික්‍යය, පුෂ්පරාග මාණික්‍යය, මරකත මාණික්‍යය, මුක්තා මාණික්‍යය, කොකුම්පොතු වැල්මී, එනසාල්, මනෝසීල, සැවැන්න මුල්, පලොල් මුල්, දේවදාර පලිඟු, ගජමද, බෙලිමුල්, රත් නෙලුම් මල්, කවඩි සාම්බ්‍රාණි, සක්, කොසොඹ පොතු, පුවඟු, බැබිල මුල්, ජටාමාංශ, රත්මල්, ඉරිවේරිය, නාමල්, ගෝරෝචන, කුකුරුමුවන්, පුෂ්කර, විළඳ, බුලත් දඬු, හෙළ අබ, දැසමන් මල්, බෝලිද්ද මල්, හෙළ නෙලුම් මල්, විෂ්ණුක්‍රාන්ති මුල්, කලුතල, ලොන් සුඹුලු, කලාඳුරු අල, සතතුප්ප, සූදුරු, මාදුරු, සුදුහඳුන්, රත්හඳුන්, දෙළුම්මල්, රසකිඳ පිටි, ගොධුම (තිරිඟු), රත්රන් කුඩු, තඹකුඩු, රිදී කුඩු, පිත්තල කුඩු, ලෝකඩ කුඩු, යකඩ කුඩු, කළුඊයන් කුඩු, සුදු ඊයන් කුඩු, කසීස්, මිනිරන්, සාදිළිංගං, ශිලාජතු, සිවන්ගුරු, කනේරු මල්, රසදිය ගෙන්දගම් රන්හිරියල්, රිදීතුන්තං, අමුකපුරු, මයුරතුතු, රිදීමැසිදැ, (රිදී පාට දියරත්රන්), කාන්දම් කුඩු, කුඹුක්මුල්, ඉඟිනි ඇට මද, රණවරා මුල්, එලවරාමුල්, එළ ඕන්තඹුරු මුල්, කිරිගරුඬ කුඩු, තිත්ත ලබු ඇට, වැටකොළු ඇට, පෙනෙල මුල්, කපු ඇට මද, පොල්පලා මුල්, රන්මැසි දැ (රත්රන්පාට දියරත්රන්), වෙනිවැල්ගැට, සැවැන්දරා මුල්, සීතමුල්, අමුක්කරාමුල්, ඉරමුසු මුල්, හාත්‍යාවාරිය අල, ගොකටු මුල්, හිඹුටු මුල්, දෙහි මුල් සහ ඇට, දොඩම් මුල් සහ ඇට, නාරම්මුල් සහ ඇට, පිනිජම්බු මුල් සහ ඇට, යකිනාරන් මුල්, පඹුරු මුල්, වැල් කහඹිලියා මුල්, හිඟුරුපියලි, මුකුණුවැන්න මුල්, පැපිලිය මුල්, ඇහැළ මුල්, දුම්මැල්ල මුල්, ආඩතෝඩ මුල්, මුඩමහන මුල්, කටුපිල මුල්, අනෝදා මුල්, අතිවිඩියන්, බෝ ඇට, කෙලිඳසාල්, සාරනමුල්, අසමෝදගන්, තුන් බෝ අත්තන මුල්, මානෙල් මල්, රත්නිටුල් මුල්, මයිල මුල් හා මල් තුල්සි (මදුරුතලා) මුල් හා මල්, කරල් හැබ මුල්, අශෝක (හෝපලුමුල්) බින්තල් අල, මාදම්පොතු, රුක්අත්තන මුල්, කංසා මුල්, කුංකුමප්පු, ගිනිහිරියා මල්, දුම්මල, වියළිකහ, අගිල්, සුවඳ කොට්ටන්, මකුලු, කීකිරිදිය මුල්, වැටකේඅරලු සහ මල්, සූරියකාන්ති මල් සහ මුල්, මදාරා ඇට, යකවනස්ස ඇට, කපු කිතිස්ස ඇට, යක්බෙරිය මුල්, අඬනහිරියා මුල්, හීන්මැඩියා කොළ, හීන්බෝවිටියා මුල්, සපුමල්, සස්සඳ මුල්, බටකිරිල්ල කොළ, ජවාදු, ඉඹුල් මැලියන්, දලුක්ලාටු, දිඹුල් මුල්, අරලිය මල්, ඕලු මල්, ඉද්ද මල්, වතුසුද්ද මල්, අඹ මුල්, අරළු, බුළු, නෙල්ලි, රන්මනිස්ස මුල්, සමඳරා මුල්, ලාකඩ (කැප්පෙටියා ලාකඩ) පුවක් මල් ඇට, රන්තැඹිලි පොල් මල් ඇට, කාමරංගාමුල්, දිවිකදුරු ඇට, ගලිස්මුල්, තල් ඇට, කිතුල් ඇට, කතුරුමුරුංගා මුල්, මුරුංගා මුල්, දොඹ ඇට, කලාඳුරු, තොලබෝමුල්, හීරැස්සපලු, වීකරල්, වඳුරුමෑ ඇට, ගොඩකදුරු ඇට, නුගමුල්, බූජපත්‍ර, මොනරකුඩුම්බිය මුල් සහ මල්, සල් මල්, දුටු සතුටු මුල්.

සාදන ක්‍රමය

මෙම ඔසු විධි ලෙස ගෙන මුල් - ඇට වර්ග කබලෙන් බැද සම බරට කිරාගත යුතුයි. දෙවනුව ඉහත කී බෙහෙත් සියල්ල වංගෙඩියකලා කොටා පෙනේර රෙද්දකින් හෝ හීන් සල්ලාඩයකින් හලා ගත යුතුයි. ඊට පසු එසේ හලාගත් බෙහෙත් පිටි සිකුරාදා ගිතෙලින්ද, සෙනසුරාදා දුම්මල තෙලින්ද, ඉරිදා අබ තෙලින්ද, සඳුදා සඳුන් තෙලින්ද, අඟහරුවාදා තල තෙලින්ද, බදාදා මී තෙලින්ද, බ්‍රහස්පතින්දා එරඬු තෙලින්ද අඹරා ගත යුතුයි. මෙය සිකුරාදා දිනක සුබ මුහුර්තයකින් ආරම්භ කිරීම මැනවි.

පංච මහා භූතයන්ට හිමි පංච දේවතාවෝ මේ අංජනමට අධිපති වෙති. එසේද වුවත් තමන්ට කැමැති දෙවිදේවතා කෙනෙක් ඔවුන්ගේ මාර්ගයෙන් එළියට පමුණුවා ගන්න පුළුවන. ඉහත කී පංච දේවතාවුන්ගෙන් සේ සෝමා නමැති දේවතාවා ප්‍රධානය.

අඳුන පීවම් කිරීමට ගත යුතු පුද-

බුලත් විටි 5, පස්තෙලෙන් පහන් 5, තැඹිලි ගෙඩි 5, කෙසෙල් ඇවරි 5, පස්පාට මල් වර්ග 5, කැවිලි 5, පලතුරු 5, පංච වර්ණ බත් ගුළි 5, පුවක් මලයි, කපුරු, පිනිදිය, හඳුන්කුරු, උක් ගස් කැල්ලයි.

එළිය බලන්න වුවමනා විට තැබිය යුතු පුද-

බුලත් 5, පස්පාට මල් වර්ග 5, උක්ගස්කැල්ලයි, කපුරුපෙති 5, හඳුන්කුරු 5, තැඹිලි ගෙඩියයි, කෙසෙල් ගෙඩි 5ක ඇවරියයි.

විශේෂ මල් අස්නක් මීට අවශ්‍යයි. එය කිසිවකු වාඩි නොවූ පුටුවකින් හෝ කෝටු නැතහොත් ලී පතුරු දොළහකින් කුඩා මල් යහනක් මෙන් සදා ගැනීම යහපති.

නියමිත ලෙස පුදතබා පළමුව කහදිය කොතලයක් ගෙන මේ මන්ත්‍ර දැහැනින් මතුරා මල් අස්නටත් ගෙටත් ඉස විධි ලෙස ජපාරම්භ කළ යුතුයි.

කහදිය මතුරන මන්ත්‍රය.

1. ඕම් - සොවුමා - පොවුරි - නොවුහා - නමී - සවඃ - හුම් සේ සෝමා ..... 7 වරයි.

තටුව පේකරන මන්ත්‍රය.

2. ඕම් - සෙස්සොවුමරා - පොවුරිසිං - නොවුහා - නමී - සවඃ - හුම් සේ සෝමා ..... 7 වරයි. ඊළඟට මෙය කියා තටුව පේකරනු.

උපුල් එස්. දොඹේපොල
පුරාණ අන්තරීක්ෂ විද්‍යා ගවේෂක
0772042708

04 >> ඕනෑම දෙවිකෙනෙක්...

කපුරු දල්වන මන්ත්‍රය.

3. ඕම් සේ සොවුරා - පොස්සිං - නොවුහ - නාහුම් සේ සෝමා ..... 7 වරයි. තටුව පේකළ පසු මෙයින් කපුරු දල්වනු.

කට්ටකුමංජල් දුම් දෙන මන්ත්‍රය.

4. ඕම් - හනොවුම් - සිනොවුහාරා - පොවුරී - රිසේ සෝමා හුම් ..... 7 වරයි. කපුරු දැල්වූ පසු මෙයින් දුම් පුදකර ජීවම පටන් ගනු.

ජීවම් මන්ත්‍ර

5. ඕම් - සේ සෝමා.....

6. ඕම් - ශ්‍රීවරිදි - හස්විත් - සේයාර් - කිවුමක්කිරා - නිරන් - ලහ්මා අස්සිං - සේසන්යාදී - හල්ලාඩා - මාපාකාම් - ශේයා - යාහක් - ස්වාහුම් සේ සෝමා.....

7. ඕම් - හනොවු - මිසිං - නොවුහාරා - පොවුරී - සෙස්සොවුමාරා පොවුරි - සිං නොවුහා - හනොවුම් - සෙස්සොවුරා - පොස්සිං - නොවු හා නාහස්සිං - රාහා අස්සෙර්රාහා - අස්සිංහා - අන්නාඅන් - ඕ පොස් සොමු - පොඩන් නොන්නා අවු - ඊහා - ආරිම් - අස්සෙව් - ඊහුම් - සේ සෝමා.....

8. ඕම් ව - අස්සෙව් - මුහරවින්දි - ඉරාදික්කිවුල් ඊනික්කා - සිංලි ඉලායායරිය - ගෙස්වයා - අලිව් - ඉසලා - අවුක්කිර්හා - අග්ගෙල් - ඉද්දම් - ඌහා - අස්සිං - රා අසෙර් - ඉක්කාදි - ඉයන් - ඉන්වා - අම්සා - අග්ගෙහා - අරියා - අයලා - අලිසිංකා - ආං ඊලික්කිවුරා - දින්වි - ඉහරමුස් සෙවු - අවුවාදිසිංගේ - ඒල් අලි - සවාහුම් - සේ සෝමා..... අඳුනට 1080 වරයි. දිනකට 108 බැගින් 10 දිනක් ජපකරනු. එළිය බලන විට 21 වරයි.

9. ඕම් - සොවුමාරා - රිසිං - නොවුහා - හමීස්වඃ - හූම් සේ සෝමා..... 7 වරයි. ජීවම් මන්ත්‍ර 108 වරක් මැතුරුවාට පසු මෙයින් මතුරා දෙවිවරුන්ට මල් තටුව කැප කරනු.

කළුවර වුණොත් එළිය කරන්න මතුරන මන්ත්‍රය.

10. ඕම් - හනොවුම් - සිංනොවුහාරා - පොවුරි - සෙස්සොවුමාරා - පොවුරි - සිංනොවුහා - හතොවුම් - ස්වඃ - හුම් සේ සෝමා..... තෙල් පානට මලක් හෝ බුලත් කැල්ලක් මතුරා දමනු. 7 වරයි. එළිය වේ. මෙය එළිය බැලීමේදී ප්‍රයෝජනයි.

ඊටම තවත් මන්ත්‍රයක්.

11. ඕම් - පුලෙයි - ලුහූම් - ස්වඃ - හුම් - සේ සෝමා..... 7 වරයි. කපුරු දල්වනු අඳුරු දුරුව එළිය වැටේ. එළිය විශාල වීමටද 10 වැනි 11 වැනි මන්ත්‍රම මැතිරිය යුතුයි.

සෝම අංජනම බැලීමේදී පානටත්, තිරය ඇඹරීමටත්, වාඩිවීමටත්, ජපකරන විශේෂ මන්ත්‍ර දැහැන් තුනක්.

1. ඕම් සාහික්සුම් සේ සෝමා..... පත්තුකරන පානට 7 වර මතුරනු.

2. ඕම් සේ සෝමා හුම් හුම් ස්වාහඃ..... පාන්තිරේ අඹරන විට 7 වරයි.

3. ඕං ටං ටං රුද්‍රග සේ සෝමා ස්වාහඃ..... වාඩි වන විට 7 වරයි.

මේ මන්ත්‍ර දැහැන් තුන සෝම අංජනම් හැර අවශේෂ අඳුන් බැලීමේදී නොමැතිරිය යුතුයි. (මේ ගුරු පොතක දැක්වෙන විශේෂ දැහැන තුනකි)

මෙම අංජනම් එළිය පිටත් කිරීමට අමුතු මන්ත්‍රයක් අවශ්‍ය නොවේ. සෝම අංජනමට අයත් (අංක 5 - 6 - 7 - 8 දරන) ජීවම් මන්ත්‍රවලින් මතුව දුම් දැමීමෙන් පංච දේවතාවුන්ගෙන් ශීඝ්‍රව වැඩ ගත හැකියි. අවශේෂ බොහෝ අංජනම්වල දෙවිවරුන් ඇතැම්විට වැඩකිරීමට ප්‍රමාදවෙතත් මෙම අංජනමට අධිපති දේවතාවෝ සිතන කියන වැඩ කඩිසරව කරති. අප පරම්පරාගත සියලුම අංජනම්වලට වඩා මෙය ශ්‍රේෂ්ඨය. මෙම අංජනමෙන් කිසි කලෙකත් බොරු නොකියැවේ. කිලිකුණු ආදී යම් යම් හේතු නිසා ඕනෑම හොඳ එළියක් සමහර දිනවල නොපෙනීයන්ට පුළුවන. සෝම මහා අංජනම පවා එසේ නොපෙනී යෑමට ඉඩ තිබේ. නමුත් ඉන් එළිය පෙනී යමක් කීවොත් එය ඒකාන්තයෙන්ම සත්‍ය වන්නේය. අතීත වර්තමාන අනාගත යන කාලත්‍රයම මේ අඳුනට හොඳාකාර පෙනේ.

ඔබ පුරාණ සිඬ විද්‍යාධරයින් මෙන් ත්‍රිකාල ඥාන දර්ශනය ලැබුමට කැමැත්තෙහිද? එසේ නම් සෝම සෘෂින් විසින් ලොවට පහළ කරන ලද 'සේ සෝමා' නම් දේවතාවා ප්‍රධාන මෙම අංජනම සිඬි කරගනු මැනවි. මෙම අංජනමට බෙහෙත් වර්ග බොහෝ ඇතත් එහි සොයා ගැනීමට දුෂ්කර බෙහෙත් එක්කවත් නැත. උත්සාහවන්තයකුට මේ බෙහෙත් සියල්ල දවස් දෙකක් තුනකින් සොයා ගත හැකිය. පංච දේවතාවුන් ලවා ලෙඩුන්ට කෂාය මැතිරවීමටත්, අමනුෂ්‍ය දෝෂ ඇති අයට තෙල් මැතිරවීමටත් මේ අංජනම ඉතා ප්‍රත්‍යක්ෂයි. මින් අඳුන් ටිකක් බුලත් කොළයකට ගෙන මල් අස්නේ තබා එළියක් බලවන අතර පංච දේවතාවුන් ලවා මතුරවා ලෙඩුන්ට පිස්සන්ට තිලක දෙනු සුවවේ. අඳුන් පෙරසේම දේවතාවුන් ලවා මතුරවා සුරයකලා ගෙල පලඳවනු. තදබල ආරක්ෂාවයි. අංගං, සූනියන්, වැල්පැන්නුම්, ඉරිපැන්නුම්, නැකැත් මර, දිවගුරු බැඳීම් නොවදී. ස්ත්‍රීන්ට ඇතිවන කළුකුමාර දෝෂ, බිලිඳුන්ට සෑදෙන බාලග්‍රහ දෝෂ, තරුණයන්ට වැලඳෙන මදන යක්ෂදෝෂ, ඇස්වහා, කටවහා, හෝවහා දෝෂ මඟ හැරේ.

යථෝක්ත අඳුන අත්හදා බැලීමේදී ඔබ විසින් පිළිපැදිය යුතු විශේෂ කරුණු කිහිපයක් හඳුනා දීමට කැමැත්තෙමි. මේ අඳුන නියමාකාරයෙන් සාදා ගත් කල මනුෂ්‍ය යහපත පිණිස බොහෝ දේ කළ හැකි බව සිහි තබා ගන්න. ඒ තුළින් ඔබට බුද්ධ දර්ශනයේ හැටියට බොහෝ කුසල් රැස් කර ගත් හැකිය. මනුෂ්‍ය ශරීරය විනිවිද යමින් (X-ray) ඔහු තුළ පවත්නා රෝග විනිශ්චය, මානසික තත්ත්වයන් මේ අඳුන තුළින් මනා සේ විග්‍රහ කළ හැක. එසේම ඒවාය අදාළ ප්‍රතිකර්මද ඖෂධීය ප්‍රතිකාරද දත හැක. ඔබ සිතන පරිදි තවත් බොහෝ යහපත් කාර්යයන් රැසක් ඉටු කර ගත හැකිවේ. එසේම තවත් අයකුගෙන් පළිගන්නා සැටි, වෛරී පුද්ගලයන් මර්දනය කරන හැටි ආදී අයහපත් දේ මේ අඳුන ඉදිරියේ සිතීම පවා බොහෝ භයානකය. කරුණා මෛත්‍රී සහගතව බහුජන හිත සුව පිණිසම මේ අංජනම් එළිය සකසා ඇත. අවංක සිතින් යුතුව ඔබ තව අයකුට හෝ තමන්ටම යහපතක් සිදු කර ගැනීම සඳහා මේ අඳුන භාවිතයට ගනී. අඳුනේ කටයුතු ආරම්භ කිරීමට මත්තෙන් ඔබ බෞද්ධයෙක් නම් තිසරණ සහිත පංචශීලය සමාදන්ව දෙවියන්ට මළගිය ඥාතීන්ට පින් පෙත් පුද කරන්න. අන්‍ය ආගමිකයෝ තම තමන් අදහන ආගමික නායකයන් සිහිපත් කරන්න. අඳුන බලන්නා සේම, අඳුනෙන් පලාපල අසන්නාද මේ ක්‍රමය අනුගමනය කරන්න.

අඳුන බලන අයගේ ආරක්ෂාව සඳහා පහත මන්ත්‍රය කියවන්න. (21 වාරයයි)

ඕං ශ්‍රී විෂ්ණු ප්‍රලාඩී තුරා පෝරුකී හන්ති සංක්‍රෙස් බහුලාඩී විෂ්ණු දේස් දේස් - ඕං ආදේස් කීමාරේ උර්ලාඩී දේහෝ ආක්‍රොන්තු බාහේස් ශ්‍රී විෂ්ණු නාරායනේ දේස් දේස්..... මෙය විශිෂ්ට දිෂ්ටි ඉගිල්ලීමකි. තෙල් මතුර ගානු. වතුර මතුරා ඉසිනු. 21 වරයි.

සිහිමූර්ඡා වුවොත්

අඳුන බලන්නා හෝ වෙනත් අයෙක් යම් හෙයකින් සිහිමූර්ඡා වූ විට පහත මන්ත්‍රය කියමින් වතුර මුහුණට ඉසින්න.

'ඕං ත්‍රිසූලධාරී ආකාශබන්ද පාතාල බන්ද පාතාලේ වාසුකී බන්ද ඊශ්වර ආසුබන්ද බන්ද ඒස්වාහං..... බලන අයගේ කෙස් රොදක් හෝ රෙද්දේ පටක් ගැට ගසනු 21 වරයි.

මේ අඳුන සඳහා අංජනම් දේවි, හනුමන්තා දේවි, රාමා දේවි, කතරගම දේවි, කාලි දේවිය හෝ ඔබ කැමැති දෙවියෙක් ගෙන්වා ගත හැක. ක්‍රිස්තු භක්තිකයන්ට ශුද්ධ වූ අන්තෝනි මුනිඳු ද ඉස්ලාම් භක්තිකයන්ට අල්ලාහ් දෙවියන්ද වෙනත් ආගමිකයන්ට තමන් අදහන ඒ ඒ දෙවිවරුන්ද සංකල්ප රූප වශයෙන් ගෙන්වා ගත හැකි බැව් සඳහන් කරමි.

අඳුන බලා අවසන් වූ පසු පහත මන්ත්‍රය එක් වරක් කියා පහන නිවන්න.

ඕං සුරාසුර ගරුඬා විදන් තරාදි සන් ඒස්වාහා..... 1 වරයි.

ඉන් පසුව අංජනම ආරක්ෂා කර ගැනීම සඳහා සුළං නොවදින ආකාරයෙන් හෙප්පුවක ලා තැබීමට උනන්දු වන්න. ඉන් පසු එම හෙප්පුව ලාච්චුවක හෝ අල්මාරියක තබා අඳුන බලන විට ඉවතට ගෙන කහදියර ඉස ප්‍රයෝජනයට ගන්න. යම් හෙයකින් ඔබ නොදැනුවත්ව හෝ අඳුනට විසබීජ ඇතුළු වුවහොත් පහත මන්ත්‍රයෙන් 7 වරක් මතුරා හෙප්පුවටත් බලන අයටත් කහදියර සහ දුම් ඉසින්න.

'ඕං නමෝ නැගනන්ද නම් සෘෂින් වහන්සේලා - ඕං නමෝ කියන මන්ත්‍රයෙන් සත්විටක් මතුරා ගෙන - අමල කිලී ගම් දෙටු දහසක් මැදින් ගොස් - තිටි කිලි ගම්දෙටු දහසක් මැදින් ගොස් එරන් සල්ගස උඩ තිබුණු එරන්මිණි සඟල ගත් ආඥාවෙන් අදත් මාගේ යන්ත්‍ර මන්ත්‍ර අඳුන් හඳුන් එවල කිලි නැතිය.'.....